ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2007

අධ්‍යාපනයේ සමකාලීන ගැටළු - **ESP 2323**

කාලය පැය තුනයි.

---

දිනය - 2007.07.15 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් මට්ටමේදී පහත දැක්වෙන ගැටළු මතුවීමට බලපා ඇති සාධක පැහැදිලි කරන්න.

අ. ජාතික මට්ටමේ විභාගවල ඇති තරඟකාරිත්වය
ආ. පෞද්ගලික උපකාරක පන්තිවල ප්‍රසාරණය
ඇ. විධිමත් පාසල් අධ්‍යාපනය වැඩ ලෝකය හා නොගැලපීම.

(ලකුණු 6 x 3 =18)

(ii) ඉහත ගැටළු අවම කිරීම උදෙසා ජාතික හා පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?

(ලකුණු 15)

02. (i) 'දේශපාලන සමාජානුයෝගය' යන යෙදුම නිර්වචනය කරන්න.

(ලකුණු 10)

(ii) දේශපාලන සමාජානුයෝගී කාරක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

(iii) දේශපාලන සමාජානුයෝගී කාරකයක් වශයෙන් පාසලේ භූමිකාව පැහැදිලි කරන්න.

(ලකුණු 13)

03. 'පසුගිය දශක කිහිපය තුළ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය ලබා ගෙන ඇති සාර්ථකත්වය පිළිබඳ ශ්‍රී ලංකාවට උදම් ඇනිය හැකිය..... එය කෙසේ වෙතත් නවතම ප්‍රතිපත්ති දිශානතියක් අවශ්‍ය වන අඩුපාඩු එහි තවමත් දක්නට ඇත.
- ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ -

එබඳු අඩුපාඩු තුනක් පහත ලැයිස්තුගත කර ඇත.

(අ) ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ සහභාගිත්වයක් නොවීම හා ගිලිහී යාම.

(ආ) ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේදී දරුවන් ලබන අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම අඩුවීම.

(ඇ) බොහෝ පාසල්වල ප්‍රාථමික අංශවල මනා කළමනාකරණ ක්‍රමයක් දක්නට නොලැබීම.

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉහත අඩුපාඩු මතු වී ඇත්තේ කුමක් නිසාද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 5 x 3 =15)

(iii) ඔබ හඳුනාගත් අඩුපාඩු මඟහරවා ගැනීමට ක්‍රමෝපායයන් යෝජනා කරන්න.

(ලකුණු 18)

04. (i) ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන කණ්ඩායම්වලට අයත් ළමයින්ට 'අධ්‍යාපනය සඳහා අයිතිවාසිකම' කෙතෙක් දුරට සහතික වී ඇත්දැයි පැහැදිලි කරන්න.

අ. අවාසිදායක ප්‍රදේශවල ජීවත්වන ළමුන්

ආ. ආබාධිත ළමුන්

ඇ. අවතැන් වූ ළමුන්

(ලකුණු 6 x 3 =18)

(iii) ශ්‍රී ලංකාවේ සැමට අධ්‍යාපනය සඳහා අයිතිවාසිකම ඉටු කර ගැනීමට අඛණ්ඩව බාධා පමුණුවන ප්‍රධාන සාධක හතරක් (04) සාකච්ඡා කරන්න.
(ලකුණු 15)

05. 'පිරිමි හා ගැහැණු ළමුන්ට අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීමෙන් පමණක්ම අධ්‍යාපනයේ ප්‍රමිතිරිබවේ සාධාරණත්වය ඉටු කර ගත නොහැක. එය ඉටු කර ගත හැකි වන්නේ සියළුම වර්ගයේ අධ්‍යාපන ක්‍රමයන්ට සමාන ප්‍රවේශය, විභාගවලදී සමාන මට්ටමේ ප්‍රවීණතා ලබා තිබීම සහ රැකියාවන්හිදී හා වෘත්තීය සචලතාවයේ දී සමාන ප්‍රතිඵල ලබා තිබීම යනාදිය මගිනි.'

(iii) ඉහත වගන්තියේ විශ්ලේෂණය කර ඇති පරිදි 'ප්‍රමිතිරිබවේ සාධාරණත්වය' යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ගැහැණු ළමයින් හා කාන්තාවන් ප්‍රවේශ වීම කෙරෙහි සුසාධ්‍යකරණය සලස්වන සාධක මොනවාද ?

(ලකුණු 10)

**(iii)** ශ්‍රී ලංකාවේ පුරුෂ පක්ෂය හා සමාන මට්ටමේ අධ්‍යාපනයක් ස්ත්‍රී පක්ෂය හිමි කර ගැනීමෙන් අනතුරුව වුවත් කාන්තාවන් තවමත් රැකියාවන් හා වෘත්තීය සචලතාව සම්බන්ධයෙන් සමාන ප්‍රවේශයක් ලබා ගැනීමේ සාර්ථකත්වයක් දක්වා නැත්තේ මන්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 13)

06. **(i)** රටක සංවර්ධනය උදෙසා උසස් අධ්‍යාපනයේ ගුණාත්මකබව අදාළ වන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 07)

**(ii)** ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකබව කෙරෙහි බලපාන සාධක හඳුනා ගන්න

(ලකුණු 08)

**(iii)** 'ගුණාත්මක බව' ඉහළ නංවා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය මගින් ගෙන ඇති පියවර මොනවා ද? (ලකුණු 08)

**(iv)** ඔබේ අදහස අනුව මෙම පියවර ක්‍රියාත්මක කිරීමේදී සුසධ්‍යාකරණය සපයන හා බාධා පමුණුවන සාධක මොනවා ද?

(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -